# චතස්සො විඤ්ඤාණට්ඨිතියො -- සතර විඥාන ස්ථිති

ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්ත වූ එය පරායණ කොට ඇති වැ සිටුනා මේ පුගුලා දනී.

විඤ්ඤාණට්ඨිතියො සබ්බාති භගවා අභිසඞ්ඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති, පටිසන්ධිවසෙන සත්තවිඤ්ඤාණට්ඨිතියො ජානාති.

විඤ්ඤාණට්ඨිතියො සබ්බා යනු: බුදුහු කර්මාභිසංස්කාරයන් ගේ වශයෙන් සතර විඥාන ස්ථිතීන් දන්නා සේක. ප්‍රතිසන්‍ධි වශයෙන් සප්ත විඥානස්ථිතීන් දන්නා සේක.

කථං භගවා අභිසංඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති: වුත්තං හෙතං භගවතා: “රූපූපයං[3] වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති[4] රූපාරම්මණං රූපපතිට්ඨං නන්‍දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති, වෙදනූපයං[5] වා භික්ඛවෙ -පෙ- සඤ්ඤූපයං වා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරපතිට්ඨං නන්‍දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජතී”ති.[a] එවං භගවා අභිසඞ්ඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති.

කිසෙයින් බුදුහු අභිසංස්කාර වශයෙන් සතර විඥානස්ථිතීන් දන්නා සේක් ද යත්: මේ වදාරන ලද මැ යි භාග්‍යවතුන් විසින්: “මහණෙනි, (තෘෂ්ණා- දෘෂ්ටි උපය විසින්) රූපයට පැමිණි හෝ රූපය අරමුණු කොට ඇතියේ රූපය ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. (සප්‍රීතික) තෘෂ්ණා ජලයෙන් තෙමනලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි, මහණෙනි, (තෘෂ්ණා- දෘෂ්ටි විසින්) වේදනාවට පැමිණි හෝ ... මහණෙනි, සංඥාවට පැමිණි හෝ ... මහණෙනි, සංස්කාරයන්ට පැමිණි හෝ විඥානය සිටුනේ සංස්කාරයන් අරමුණු කොට ඇති යේ සංස්කාරයන් ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටියි. තෘෂ්ණොදකයෙන් තෙමන ලදුයේ වෘද්ධියට විරූඪබවට විපුල බවට පැමිණේ යයි මෙසේ බුදුහු අභිසංස්කාර වශයෙන් සතර විඥානස්ථිතීන් දන්නා සේක.